**නව මූල්‍යයන ආකෘතිය යටතේ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතිය මැලේරියාව සංරචකය - 2016**

---

නව මූල්‍යයන ආකෘතිය යටතේ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ (ජීඑෆ්ඒටීඑම්) මැලේරියාව සංරචකයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල අතර 2016 පෙබරවාරි 29 දින එළඹි අංක 898-එල්කේඒ-එම්-එම්ඕඑච් දරන ප්‍රදාන ගිවිසුමේ 13(ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ප්‍රදාන ගිවිසුමට අනුව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. ශ්‍රී ලංකාවේ ගැටුම්වල බලපෑමට ලක්වූ දිස්ත්‍රික්කවල මායිම් ප්‍රදේශවල ජීවත්වන ජනතාව අතර දැඩි මැලේරියා පාලනය සඳහා කටයුතු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. නව මූල්‍යයන ආකෘතිය යටතේ දැඩි මැලේරියා පාලනය සඳහා ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 921.28 කට සමාන එජඩො මිලියන 7.05 ක් වන අතර, සම්පූර්ණ මුදලම මූල්‍යයනය කිරීමට ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර, 2018 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා  පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල  දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව. සහ

(ඌ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති තොරතුරු ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද අනෙකුත් වාර්තාවල ඇතුළත් තොරතුරු සමඟ එකඟ වන බවත්ය.

## 3. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 3.1 මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.මිලියන 181.66 කට සමාන එජඩො මිලියන 1.21 ක් විය. විස්තර පහත දැක්වේ.

| වර්ගය | 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | |
|---|---|---|
| | එජඩො | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 220,794 | 33,920,523 |
| මැලේරියා පාලන කටයුතු | 991,446 | 147,745,226 |
| | 1,212,240 | 181,665,749 |

### 3.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2016 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ව්‍යාපෘතියේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පහත දැක්වේ.

| | 2016 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | එජඩො | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | |
| විදේශ ආධාර - ප්‍රදානවලින් ලද මුදල් | 886,875 | 132,162,099 |
| දේශීය අරමුදල්වලට අදාළ විදේශ ආධාර | 15,359 | 2,288,839 |
| ටෙන්ඩර් ආදායමෙන් ලද මුදල් | 54 | 8,000 |
| වියදම් සඳහා ගෙවන ලද මුදල් | (991,446) | (147,745,226) |
| වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාවය) | (89,158) | (13,286,288) |
| ක්ෂය | 270,121 | 40,253,371 |
| ගෙවිය යුතු ශේෂ වැඩිවීම | 492,429 | 75,651,863 |
| ලැබිය යුතු ශේෂ වැඩිවීම | (434,086) | (66,688,699) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | (7,474) | (1,113,732) |
| විනිමය හුවමාරු වෙනස | (5,026) | - |
| වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික | (6,012) | (895,992) |
| මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් | 220,794 | 33,920,523 |

**ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහය**

| | | |
|---|---:|---:|
| ස්ථාවර වත්කම් | (220,794) | (33,920,523) |
| | -------------- | ---------------- |
| ආයෝජන කටයුතුවල යොදාගත් ශුද්ධ මුදල් | (220,794) | (33,920,523) |
| මුදල් ශුද්ධ වැඩිවීම/ ශුද්ධ අඩුවීම | නැත | නැත |
| 2016 ජනවාරි 01 දිනට ශේෂය | නැත | නැත |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | නැත | නැත |

## 4. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 4.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, වර්ෂය තුළදී ලැබුණු අරමුදල් සහ 2016 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | වර්ෂය තුළ ලද අරමුදල් | | 2016 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---:|---:|---:|---:|---:|---:|
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජීඑෆ්ඒටීඑම් | 7.05 | 921.28 | 0.89 | 132.16 | 0.81 | 120.65 |
| ශ්‍රී ලං ර | - | - | 0.03 | 4.00 | 0.03 | 4.00 |
| | 7.05 | 921.28 | 0.92 | 136.16 | 0.84 | 124.65 |

### 4.2 භෞතික ප්‍රගතිය

ලැබුණු තොරතුරු අනුව, ශ්‍රී ලංකාව මැලේරියාව තුරන් වූ රටක් ලෙස පෙර වර්ෂයේදී ප්‍රකාශයට පත් කර තිබුණද, විදේශ රැකියාවලින් පසුව සංක්‍රමණය වූ ශ්‍රී ලාංකිකයන් 28 දෙනෙකු හා විදේශවලින් පැමිණි පුද්ගලයින් 13 දෙනෙකු ඇතුළත් මැලේරියා රෝගීන් 41 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළදී දිවයින ඇතුළත අනාවරණය කර ගෙන තිබුණි. එබැවින් රෝගය පැතිරයාම පිළිබඳ අවදානම අවම කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ විදේශීය ශ්‍රමිකයන් හා විදේශීය අමුත්තන් සඳහා පිරික්සීමේ (screening) පහසුකම් සැපයීම, ජංගම සායන පැවැත්වීම හා කීට විද්‍යා ආවේක්ෂණ පරීක්ෂණ පැවැත්වීම, ඉහළ අවදානම් ප්‍රජාවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම යනාදී කාර්යයන් කිහිපයක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය යොදා ගැනීම හා ඒ සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාගැනීම සඳහා වූ ප්‍රමාදයන් හේතුවෙන් රෝග විනිශ්චය රසායනාගාර ප්‍රතිසංස්කරණය හා නවීකරණය, ප්‍රාදේශීය මධ්‍යස්ථානවල පහසුකම් ඉහළ නැංවීම, කීට විද්‍යා ආවේක්ෂණ පද්ධතිය සඳහා පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම සහ ක්ෂේත්‍ර උපකරණ ප්‍රසම්පාදනය යනාදී කාර්යයන්

සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් සලසන ලද එකතුව රු.මිලියන 96.72 ක වෙන්කිරීම් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර නොතිබුණි.

(ආ) අඛණ්ඩ ලක්ෂණයක් ලෙස, ව්‍යාපෘතිය විසින් සංවිධානය කරනු ලැබූ පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන්ගේ සහභාගීත්වය ඉතා පහළ මට්ටමක පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් සංවිධානය කරන ලද වැඩමුළු 05 ක් සඳහා නිලධාරීන් 840 දෙනෙකුගේ සහභාගීත්වය අපේක්ෂා කර තිබුණද, නිලධාරීන් 530 දෙනෙකු පමණක් සහභාගී වී තිබූ බව විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ පුහුණු වැඩසටහන් සඳහා වෙන්කරන ලද රු.මිලියන 5.76 ක මුළු වෙන්කිරීමෙන් රු.මිලියන 3.16 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

## 4.3 මූල්‍ය පාලනයට අදාළ ගැටලු

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ නිලධාරීන්ට ගෙවන ලද අතුරු අග්‍රිම පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රම මුදල් රෙගුලාසිවල දක්වා ඇති පරිදි අනුගමනය කර නොතිබුණි. නිරීක්ෂණය වූ අවස්ථා පහත දැක්වේ.

(i) මුදල් රෙගුලාසි 371 හි දක්වා ඇති රු.100,000 ක සීමාව ඉක්මවමින් අවස්ථා 3 කදී එකතුව රු.457,575 ක අතුරු අග්‍රිම ලබාදී තිබුණි. අවස්ථා 37 කදී ලබා දී තිබූ එකතුව රු.මිලියන 1.49 ක් වූ උප අග්‍රිම දින 14 සිට මාස 09 ක් වූ කාලපරිච්ඡේදයක ප්‍රමාදයන් සහිතව නිරවුල් කර තිබුණි. තවද අවස්ථා 19 කදී ලබාදුන් එකතුව රු.632,275 ක් වූ අග්‍රිම අරමුණු කළ කාර්යයන් සඳහා යොදා නොගෙන දින 03 සිට දින 226 දක්වා කාලපරිච්ඡේදයක ප්‍රමාදයන් සහිතව නිරවුල් කර තිබුණි.

(ii) අරමුණු කළ කාර්යය සඳහා යොදා ගැනීමේ ආසන්නම දිනයට පෙර තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 09 කදී එකතුව රු.628,900 ක් වූ අතුරු අග්‍රිම නියමිත දිනට පෙර, දින 25 සිට දින 80 දක්වා කාලපරිච්ඡේදයකදී ලබාදී තිබුණි.

(ආ) පෙර මූල්‍යයන ආකෘතිය යටතේ ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද රු.මිලියන 243.35 කට සමාන එජඩො මිලියන 1.58 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භෞතික සත්‍යාපනයන් සිදුකර නොතිබුණි.

## 4.4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

ව්‍යාපෘතියේ පහසු ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රධාන වශයෙන් බලපාන තනතුරු වන වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් දෙදෙනෙකු, මැලේරියා සහකාරවරුන් 21 දෙනෙකු හා රෝග වාහක පාලන සහකාරවරුන් (Vector Control Assistants) 9 දෙනෙකු ඇතුළත් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2017 ජුනි 14 වන විටත් ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි.